336

RARE

# විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි ගැටුම් කළමනාකරණයෙහිලා පුස්තකාල කළමනාකාරිත්වය විසින් ගනු ලබන ක්‍රියා මාර්ගවල ශක්‍යතාව විමසා බැලීම

*(විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන හා විශ්වවිද්‍යාල අනුබද්ධිත අධ්‍යයන ආයතන පුස්තකාල ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයකි)*

එම්.ඒ.මිල්ටන්

**LISC/ R/ 073/ 98**

*කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීයවිද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජීයවිද්‍යාපති පර්යේෂණ උපාධියෙහි පාර්ශවීය අවශ්‍යතාවයක් සපුරාලනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කෙරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධය*

පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යනාංශය
සමාජීයවිද්‍යා පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

**2004**- පෙබරවාරි

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 336 |
| වර්ග අංකය | |

## නිබන්ධ සාරාංශය

මෙම අධ්‍යයනයේ මාතෘකාව වන්නේ "විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි ගැටුම් කළමනාකරණයෙහිලා පුස්තකාල කළමනාකාරිත්වය විසින් ගනු ලබන ක්‍රියා මාර්ගවල ශක්‍යතාව හෙවත් හැකියාව විමසා බැලීම යි." මෙම අධ්‍යයනයේ අරමුණ ද එයවේ. ඒ අනුව උපයුක්ත අධ්‍යයනයෙන් අනාවරණීත මූලික කරුණු සංක්ෂිප්තව මතු දැක් වේ.

පළමුවන පරිච්ජේදයෙන් පොදුවේ විශ්වවිද්‍යාලයක හා එහි පුස්තකාලයක පරමාර්ථ හා අරමුණු ද ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි හා එහි පුස්තකාලයන්හි පරමාර්ථ හා අරමුණු ද විද්වත් මත ඇසුරෙන් පැහැදිලි කරන ලදි. එසේම මෙහිදී අධ්‍යයනයෙහි වැදගත්කම, අධ්‍යයන ගැටලුව, අධ්‍යයනයෙහි අරමුණු, ක්‍රමවේදය, අධ්‍යයනයෙහි සීමා, සාහිත්‍ය විමසුම හා පරිච්ජේද සංවිධානය පිළිබඳව වූ කරුණු ඉදිරිපත් කර ඇත.

අධ්‍යයනයෙහි වැදගත්කම යටතේ විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි පවත්නා විවිධාකාර ගැටුම් හා එම ගැටුම් කළමනාකරණයෙහිලා පුස්තකාල කළමනාකාරිත්වය විසින් තත්කාලීනව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග හා විධික්‍රම ද ඒවායේ යෝග්‍ය අයෝග්‍ය භාවය පිළිබඳව ද මූලිකවම කරුණු විමර්ශනය කරන ලදි. ගැටුමට හේතු සාධක හඳුනාගැනීම හා විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි මානව සම්පත් කළමනාකරණයේ පවතින අඩුලුහුඩුකම් හා ගැටුම් නිසා ඇතිවී තිබෙන අහිතකර හා හිතකර ප්‍රතිඵල මොනවාද යන්න දැනගැනීමටත් එසේ ගැටුම් කළමනාකරණය කිරීමෙන් විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි අහිතකර ගැටුම් විරහිත සුබනම්‍ය පරිසරයක් ඇති කිරීමට මෙවැනි අධ්‍යයනයක ප්‍රතිඵල උපකාරී වන ආකාරය පැහැදිලි කරන ලදි.

අධ්‍යයන ගැටලුව යටතේ ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාල පුස්තකාල ක්ෂේත්‍රය තුළ බෙහෙවින් දිවිය හැකි ගැටුම් කවරේද, ඒවාට හේතු සාධක කවරේද, එකී හේතු දුරු කර ලීමට පියවර ගෙන තිබේද පවත්නා ගැටුම් නිරාකරණය සඳහා කුමන ක්‍රමවේදයක් අනුගමනය කරන්නේ ද ගැටුම් නිවාරණ ක්‍රමවේදයන් පවතින්නේ ද යන මූලික ප්‍රශ්න විමර්ශනයට ලක් කිරීම හා එකී කරුණු සම්බන්ධව වර්තමාන කළමනාකරණ සිද්ධාන්ත වලට අනුව විසඳුම් සෙවීමෙහිලා විශ්වවිද්‍යාල පුස්තකාල කළමනාකරුවන්ට විධිමත් කළමනාකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ අවබෝධයක් පවතින්නේ ද යන්න පිළිබඳව කරුණු දක්වා ඇත.

අධ්‍යයනයේ අරමුණු දැක්වීමේදී අධ්‍යයනයෙන් සමස්තයට ලැබෙන දායකත්වය හා වැදගත්කම නිශ්චිත අරමුණු හතරක් (04) හා පොදු අරමුණු දෙකක් (02) ලෙස සමස්ත අරමුණු හයක් (06) යටතේ විවරණය කරන ලදි.

මෙහිදී අධ්‍යයනයේ ක්‍රමවේදය පිළිබඳව සංක්ෂිප්තව කරුණු ඉදිරිපත් කර ඇති අතර තුන්වන පරිච්ඡේදයේ දී අධ්‍යයනයේ ක්‍රමවේදය පිළිබඳව විස්තරාත්මකව හා පැහැදිලිව කරුණු දක්වා ඇත.

අධ්‍යයනයෙහි සීමා හා සාහිත්‍ය විමසුමේදී අධ්‍යයනයෙන් පැන නැගුනු සීමාවන් හා බාධක ද ඒවා නිරාකරණය කළ ආකාරය හා සාධාරණීකරණය කළ ආකාරය දක්වන ලදි. එසේම සාහිත්‍ය විමසුම යටතේ පෙර කරන ලද අධ්‍යයනයන් හා මෙම අධ්‍යයනය අතර ඇති සමාන හා අසමානකම්ද විශේෂතාද සාහිත්‍ය ගවේෂණය කළ මාර්ග හා විධික්‍රම පිළිබඳව දීර්ඝ ලෙස පැහැදිලි කරන ලදි.

දෙවන පරිච්ඡේදයෙන් අධ්‍යයනයට පාදක සංකල්ප සවිස්තරාත්මකව ඉදිරිපත් කිරීම හා අධ්‍යයනයේ මෙහෙයුම්කරණය පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීම සිදුකරන ලදි. එහිදී සංකල්පනාත්මක රාමුව හා මෙහෙයුම්කරණය **(Conceptual framework and operationalization)** ගැටුම් කළමනාකරණ ක්‍රියාවලිය, ගැටුම් කළමනාකරණයේ න්‍යායාත්මක පසුබිම හා සංකල්පනාත්මක රාමුව යන ප්‍රධාන ශීර්ෂ තුන යටතේ කරුණු පෙළගස්වන ලදි.

ගැටුම් කළමනාකරණ ක්‍රියාවලිය යටතේ ගැටුම පිළිබඳව පොදු හා විෂයානුබද්ධ නිර්වචන ද ශක්‍යතාව හෙවත් හැකියාව පිළිබඳව නිර්වචන සඳහා පොදු හා විෂය ශබ්ද කෝෂ හා විශ්වකෝෂ මෙන්ම විෂයානුබද්ධ අතිකුත් පෙළ ග්‍රන්ථයන්හි අදහස් පාදක කර ගන්නා ලදි.

දෙවනුව සමස්ත ගැටුම් කළමනාකරණයේ න්‍යායාත්මක පසුබිම පිළිබඳ කළමනාකරණ විෂය විශේෂඥයින් විසින් ඉදිරිපත් කරන ලද ස්වකීය මත හා න්‍යායයන් පිළිබඳව පුළුල් විශ්ලේෂණයක යෙදිනි.

අනතුරුව හඳුනාගත් විචල්‍යය පහළොවක් (15) යටතේ ගැටුමෙහි ප්‍රතිවිපාක හා අදාළ විචල්‍යය කෙරෙහි බලපාන අතිකුත් අනු සාධක හඳුනා ගනිමින් ඒවා සවිස්තරව ලැයිස්තු ගත කරමින් මෙහෙයුම්කරණය සිදු කළෙමි. මෙහෙයුම්කරණය තුළින් මෙම අධ්‍යයනය යොමුවන දිසාව පැහැදිලි කිරීමට යත්න දැරුවෙමි.

දෙවන පරිච්ඡේදයේ තුන්වන කොටස සංකල්පනාත්මක රාමුව **(Conceptual framework)** සඳහා වෙන් කෙරිණි. එහිදී අධ්‍යයනය උදෙසා ගොඩනගන ලද ස්වාධීන විචල්‍යය පහළොවක් (15) හඳුන්වා දී ඇති අතර ඒවා මෙහෙයුම්කරණයට හා සංකල්පීයකරණයට නතු කළෙමි.

තුන්වන පරිච්ඡේදය අධ්‍යයනයෙහි ක්‍රමවේදය වේ. එහිදී අධ්‍යයන රාමුව යටතේ අධ්‍යයනයට පාදක වූ පුස්තකාලයන්හි අධ්‍යයනය සඳහා සහභාගි කරගත් සේවක පිරිස් අග්‍ර මධ්‍ය හා පහළ කළමනාකරුවන් ලෙස ස්ථරවලට බෙදා දැක්විමද ගැටුමට මේ සියලුම පාර්ශවවල දායකත්වය පිළිබඳවද විස්තර ඉදිරිපත් කළෙමි.

දෙවනුව අධ්‍යයනයට අදාළ උපන්‍යාස හෙවත් කල්පිත **(Hypotheses)** තුනක් **(03)** ගොඩනගන ලදි. ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන සාධක යටතේ ගොඩ නගන ලද ස්වාධීන විචල්‍ය පාදක කර ගනිමින් මෙම උපන්‍යාස ගොඩ නගන ලදි.

අනතුරුව අධ්‍යයනයේ ක්‍රමවේදය **(Methodology)** පිළිබඳ පැහැදිලි කර ඇත. එහිදී මෙම අධ්‍යයනය ප්‍රත්‍යක්ෂ මූලික අධ්‍යයනය **(Empirical study)** බවත් ප්‍රාථමික දත්ත මූලික කරගෙන සිදු කරන්නක් බවත් දක්වන ලදි.

දත්ත රැස්කිරීමේ විධික්‍රම යටතේ අධ්‍යයනය සඳහා භාවිත කළ ප්‍රධාන දත්ත රැස්කිරීම් මාධ්‍යය වූ ප්‍රාථමික හා ද්විතියික දත්ත මූලාශ්‍ර එනම් ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මගින් දත්ත ලබා ගැනීමේදී ක්‍රියා කළ ආකාරය පිළිබඳව සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කෙරිණි. දත්ත රැස්කිරීමේදී ස්වාධීන විචල්‍යය පහළොවක් (15) ඇසුරෙන් ගොඩ නගන ලද ප්‍රශ්නාවලි දෙක පිළිබඳව හා සරල සසම්භාවී නියැදිය යටතේ තෝරාගත් නියැදිය වෙත ප්‍රශ්නාවලි දෙක (02) යොමු කරමින් පිළිතුරු ලබාගත් ආකාරයත් පිළිබඳව විස්තර කරන ලදි. එසේම සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ හා සමීක්ෂණ මගින් දත්ත ලබා ගැනීමේදී අනුගමනය කළ ක්‍රියා පරිපාටියද මේ යටතේ දක්වන ලදි.

ද්විතියික දත්ත මූලාශ්‍ර මගින් දත්ත ලබා ගැනීමේදී භාවිත කළ සඟරා ලිපි හා මුද්‍රිත ග්‍රන්ථ ආදිය පරිශීලනය කළ ආකාරය හා ඒ සඳහා භාවිත කළ තොරතුරු මධ්‍යස්ථාන හා පුද්ගලයන්ද අන්තර්ජාලීය ගවේෂණයන් පිළිබඳවද තොරතුරු මේ යටතේ දක්වා ඇත.

මෙහිදී ප්‍රශ්නාවලිය ආශ්‍රිත නියමු අධ්‍යයනය හා ඒ සඳහා තෝරාගත් ආයතන හා සේවක සංඛ්‍යාවන් ද ප්‍රශ්නාවලිය පූර්ව පරීක්ෂාවෙන් ලද ප්‍රතිඵල හා ප්‍රතිචාර මත ප්‍රශ්නාවලියේ කරන ලද වෙනස්කම් හා ප්‍රශ්නාවලිය නැවත ගොඩනැගීම පිළිබඳව ද සවිස්තරාත්මකව දක්වා ඇත.

නියැදි සැලැස්ම යටතේ අධ්‍යයනයෙහි විශ්වසනීයභාවය තහවුරු කිරීම සඳහා අධ්‍යයනයට පාදකවූ පුස්තකාල සංඛ්‍යාව හා තනතුරු අනුව ඒවායේ සේවක සංඛ්‍යාව ද ඉන් නියැදිය සඳහා තෝරාගත් ප්‍රමාණය ද තෝරා ගැනීමේ අනුපාතයෙහි සාධාරණ භාවය මෙන්ම නියැදිකරණයකින් තොරව සංගහණයම තෝරා ගැනීමට හේතු සාධක මෙන්ම ස්ත්‍රී පුරුෂ වශයෙන් අනුපාතිකව තෝරාගැනීමට ප්‍රයත්න දැරීම ආදී කරුණු මේ යටතේ දක්වන ලදි.

නියැදි සැලැස්ම යටතේ නියැදීම් ක්‍රියා පටිපාටිය දක්වා ඇත. මෙහිදී සරල සසම්භාවී නියැදියක් තෝරා ගැනීමට හේතු එනම් සංගහණය සමජාතීය හා සමවරණයක් පැවතීම යන කරුණු සැලකීමට ගැනීමත් දත්ත එක් රැස් කිරීමේදී ඇතිවිය හැකි විෂමතා මගහරවා ගැනීම සඳහා මෙවැනි නියැදීම් ක්‍රමයක් තෝරාගත් බවත් දක්වා ඇත. එසේම සමස්ත සංගහණය තනතුරු අනුව අග්‍ර කළමනාකරුවන්, මධ්‍ය කළමනාකරුවන් පහළ කළමනාකරුවන් හා කළමනාකරුවන් නොවන යනුවෙන් ප්‍රධාන ස්ථර හතරකට (04) බෙදා දැක්වීමත් නියැදීම් ක්‍රියා පටිපාටිය යටතේ දක්වන ලදි.

තුන්වන පරිච්ඡේදයේ වැදගත්ම අංශය දත්ත පිරිසැකසීම වේ. දත්ත පිරිසැකසීම යනු සමස්ත අධ්‍යයනයේ ප්‍රතිඵල ලබාගන්නා ක්‍රමවේදය වේ. දත්ත පිරිසැකසීම යටතේ ප්‍රශ්නාවලී ඇසුරින් එකතු කරගත් දත්ත හැසිරවීමේ පහසුව සඳහා සමානුපාතිකව කළමනාකරණය කළ ආකාරය හා එක් එක් විචල්‍යය සඳහා එක් එක් ප්‍රතිචාරකයාගේ ප්‍රතිචාර ප්‍රමාණයන්හි මට්ටම (තරම) **(Degree of the Responder)** **අහිතකර, මධ්‍යස්ථ හා හිතකර පරාස තුන (03).** යටතේ ගොනු කර දක්වන ලදි.

අනතුරුව ප්‍රතිචාරක දත්තවල මිනුම් පරිමාණයන් පිළිබඳව සලකා බැලීම සඳහා තෝරාගත් මිනුම් පරිමාණයන් සකස් කරන ලදි. මෙහිදී එක් විචල්‍යයක් සඳහා එක් ප්‍රතිචාරකයකුට ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ඇසුරු කර ගනිමින් මෙම මිණුම් පරිමාණය සකස් කර ගන්නා ලදි. එකී මිණුම් පරිමාණය භාවිත කරමින් සමස්ත විචල්‍යයන්හි ප්‍රතිචාර ප්‍රමාණයන්හි මට්ටම (තරම) මැන බැලූ ආකාරය පැහැදිලි කරන ලදි. ගැටුම් සංකල්පය හෝ ගැටුම් ක්‍රියාවලිය හෝ එහි ප්‍රතිවිපාක

මෙතෙකැයි කියා ප්‍රමාණාත්මකව ගණනය කිරීම හෝ විස්තර කිරීම අපහසු කාර්යය කි. එහෙත් මෙම අධ්‍යයනයේ දී ගැටුම සංඛ්‍යාත්මකව මැන බලන ලදි. මිණුම් පරිමාණ මත ගැටුමෙහි තීව්‍රතාව මැන බැලීමට ක්‍රියාකර ඇත. ඒ සඳහා සංඛ්‍යාන විද්‍යාවේ භාවිත විස්තරාත්මක හා අනුමිතික සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිත කරන ලදි.

මිනුම් පරිමාණය සකස් කර ගැනීමෙන් පසුව දත්ත විශ්ලේෂණාත්මක උපකරණ පිළිබඳව හඳුන්වා දී ඇත. මෙහිදී සංඛ්‍යාන විද්‍යාවේදී දත්ත විශ්ලේෂණය කිරීම සඳහා භාවිත කරන විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රමය **(Descriptive Statistical Techniques)** යටතට ගැනෙන ප්‍රතිශත වටිනාකම්, **(Percentage)** මධ්‍යන්‍යය **(Mean)** මාතය, **(Mode)** මධ්‍යස්ථය, **(Median)** සම්මත අපගමනය **(Standard Deviation)** හා අනුමිතික සංඛ්‍යාන ශිල්ප ක්‍රම **(Inferential Statistical Techniques)** යටතේ දැක්වෙන සහසම්බන්ධතා **(Correlation coefficient)** හා කයි වර්ග පරීක්ෂාව **(Chi-square)** යන දත්ත විශ්ලේෂණ ක්‍රම භාවිතය පිළිබඳවත් ඒ සඳහා යොදා ගනු ලැබූ සංඛ්‍යානමය සූත්‍ර පිළිබඳවත් විස්තර දක්වන ලදි. එසේම සහසම්බන්ධතා සංගුණකය පරීක්ෂා කර බැලීම සඳහා ගොඩ නගන ලද මිනුම්දඬු පිළිබඳව ද මෙහිදී විස්තර කරන ලදි.

දත්ත විශ්ලේෂණයේ අවසාන අදියර වන්නේ දත්ත ඉදිරිපත් කිරීම වේ. මේ සඳහා ස්ථම්භ හා පයි ප්‍රස්ථාර සටහන් යොදා ගත් බව දක්වා ඇත.

හතරවන පරිච්ඡේදය දත්ත විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම සඳහා වෙන් වී ඇත. මෙහිදී පළමුව දත්ත විශ්ලේෂණය ද දෙවනුව උපන්‍යාස හෙවත් කල්පිත පරීක්ෂාවද සිදු කරන ලදි.

දත්ත විශ්ලේෂණය අදියර තුනකි. (03) පළමුවන අදියරේ දී අධ්‍යයනයට පාදක වූ පුස්තකාල සංඛ්‍යාව හා සේවක සංඛ්‍යාව පිළිබඳව වූ දත්ත විශ්ලේෂණයන්හි ප්‍රතිඵල සංඛ්‍යාත්මකව හා ප්‍රතිශතාත්මකව විශ්ලේෂණය කරමින් වගු ආශ්‍රයෙන් හා ස්ථම්භ හා පයි ප්‍රස්ථාර සටහන් භාවිත කරමින් ඉදිරිපත් කර ඇත.

දත්ත විශ්ලේෂණයේ දෙවන අදියර යටතේ විචල්‍යය විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම උපයෝගී කරගන්නා ලදි. මෙහිදී ස්වාධීන විචල්‍යය පහළොවක් (15) හා ගැටුමෙහි ප්‍රතිවිපාක මැන බැලීම සඳහා උපයෝගී කරගත් විචල්‍යය පහළොවක් (15) ද එකතුව විචල්‍ය තිහක් (30) සඳහා ප්‍රතිචාරක දත්ත ඇසුරින් එක් එක් විචල්‍යයෙහි ප්‍රතිචාර ප්‍රමාණයන්හි මට්ටම (තරම) අහිතකර,

මධ්‍යස්ථ හා හිතකර පරාස යටතේ මැන බලන ලදි. දත්ත විශ්ලේෂණයේ ප්‍රතිඵල සංඛ්‍යාත්මකව හා ප්‍රතිශතාත්මකව වගු හා ස්ථම්භ හා පයි ප්‍රස්ථාර ඇසුරෙන් ඉදිරිපත් කරන ලදි.

විචල්‍යය විශ්ලේෂණයේ ප්‍රතිචාරක ලකුණු ප්‍රමාණයන් විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම ඇසුරෙන් විශ්ලේෂණය කල අතර එහි ප්‍රතිඵල මධ්‍යන්‍යය, **(Mean)** මාතය, **(Mode)** මධ්‍යස්ථය, **(Median)** හා සම්මත අපගමනය **(Standard Deviation)** යන මිනුම් යටතේ දක්වන ලදි.

මෙම දත්ත විශ්ලේෂණයේ ප්‍රතිඵල මත ගැටුම කෙරෙහි හා ගැටුමෙහි ප්‍රති විපාක කෙරෙහි එක් එක් විචල්‍යයයේ බලපෑම විග්‍රහ කර දක්වන ලදි.

දත්ත විශ්ලේෂණයේ තුන්වන අදියර උපන්‍යාස හෙවත් කල්පිත පරීක්ෂාව වේ. කල්පිත පරීක්ෂාව සඳහා අනුමිතික සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිත කළෙමි. එහිදී සහසම්බන්ධතා සංගුණකය හා කයි වර්ග පරීක්ෂාව යොදා ගන්නා ලදි. සහසම්බන්ධතා සංගුණක අගයන් පරීක්ෂා කිරීමේදී ස්වාධීන විචල්‍ය සඳහා ලබාගත් ප්‍රතිචාරක ලකුණු උපයෝගී කර ගන්නා ලදි. ඉන් ලද සංඛ්‍යාත්මක අගයන් දත්ත විශ්ලේෂණයේ දී ගොඩනගන ලද මිනුම් පරිමාණ හා සසඳා බලමින් විශ්ලේෂිත ප්‍රතිඵල ඉදිරිපත් කරන ලදි.

කයි වර්ග පරීක්ෂාවේ දී ස්වාධීන විචල්‍යය සඳහා ලබාගත් ප්‍රතිචාරක ලකුණු උපයෝගී කර ගන්නා ලදි. ඒ සඳහා සංඛ්‍යාන විද්‍යාවේ සූත්‍ර භාවිත කල අතර ඉන් ලද සංඛ්‍යාත්මක අගයන් කයි ව්‍යාප්ති සටහනේ අගයන් සමග ගලපා ගනිමින් උපන්‍යාස පරීක්ෂාව සඳහා යොදා ගන්නා ලදි. දත්ත විශ්ලේෂණ සඳහා පරිගණක තාක්ෂණය යොදා ගත් අතර එම ප්‍රතිඵල අත්හුරු ක්‍රමයෙන් ද පරීක්ෂාවට ලක් කර තහවුරු කෙරිණි.

කල්පිත පරීක්ෂාවේ ප්‍රතිඵලය නම් කල්පිත තුනම (03) සනාත විය.

පස්වන පරිච්ඡේදයේ නිගමන හා යෝජනා යටතේ විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි ගැටුම් පවතින බවත් එම ගැටුම් කළමනාකරණයෙහිලා පුස්තකාල කළමනාකාරිත්වය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග හෙවත් ක්‍රමවේදයන්හි ශක්‍යතාව හෙවත් හැකියාව ඉතා දුර්වල බව මූලිකවම නිගමනය කෙරිනි.

අධ්‍යයනයෙන් හෙළිවූ කරුණු පදනම් කර ගනිමින් විශ්වවිද්‍යාල පුස්තකාල පද්ධතිය පවතින තත්ත්වයෙන් ගොඩ ගැනීම සඳහා යෝජනා පහළොවක් (15) යෝජනා යටතේ ඉදිරිපත් කරන ලදි.

කැලණිය විශ්වවිද්‍යාලය
1 - JUL 2006
පුස්තකාලය